# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලයේ
ප්‍රවෘත්ති ප්‍රකාශනය

4 වන කලාපය, අංක 4 | 1983 ඔක්තෝබර්/දෙසැම්බර්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ
පරිත්‍යාගයකි.

පටුන

* කතු වැකිය 1,3
* මණ්ඩලීය කටයුතු 4, 8, 13
* මහජන පුස්තකාල පාඨක සමාජ 5, 6, 7
* The Author, The Reader and the concept of copyright -II 9, 14
* Health Literature library and Information Sciences Sri Lanka 10, 12
* ග්‍රන්ථ විචාර - කඳ දෙව් උපත 15, 16
* Classification Schemes - for Geography Materials - IV 17, 18
* කුඩා කාර්මික ආයතන පුස්තකාල 19
* පුවත් ලුහුඬින්/News 13, 16, 20

## බුද්ධි සංවර්ධනයට රජය පියවර ගනී

මෙම රජය පසුගිය වසර කීපය තුල රටෙහි ආර්ථික පදනම ශක්තිමත් කිරීම සඳහා ආරම්භ කොට ඇති මහා ව්‍යාපාර මහජනතාවට රහසක් නොවේ. එසේ වුවත් බොහෝ දෙනා රටෙහි සාරධර්ම හා සංස්කෘතික පදනම බිඳ වැටීගන යන හැටි ගැන කම්පා වී සිටිති. මේ ගැන රජය කුමන පියවරක් වත් ගෙන නැතැයි 'කසු කුසු' ද විටින් විට ඇසේ.

ආර්ථික පදනමක් දුර්වල වූ හැම අවස්ථාවේම, හැම ජාතියේම සංස්කෘතික පරිහානියක් ඇති වූ බවද සවිරුත් පාහේ දන්නා කරුණකි. එසේ නම් සාහිත්‍ය, කලා, චරියා ධර්ම, ආගම් යනාදි සංස්කෘතික ජීවිතයේ විවිධ අංශවල සංවර්ධනයක් ඇතිවිය හැක්කේ මනා ආර්ථික පදනමක් ඇති වූ පසුය. එම ආර්ථික පදනම දැන් ගොඩනැගෙමින් පවතී.

එහෙයින් දැන් සංස්කෘතික අංශ කෙරෙහි අවධානය යොමු කිරීමට කාලය එළඹ ඇත්තේය. **රටක බුද්ධි වර්ධනය හුදෙක් රඳා පවත්නේ එරටෙහි ප්‍රකාශයට පත්වන විවිධ වූ පොතපත කෙරෙහිය. වැඩි වැඩියෙන් මනා පොත පත ප්‍රකාශනය කරත්ම කිසියම් රටක ජනතාවගේ කියවීමේ පුරුද්ද, උසස් වින්දනය, විෂය දැනුම, චින්තන ශක්තිය, හා නිර්මාණ ශක්තිය ආදී බුද්ධි වර්ධනයේ විවිධ අංග රාශියක් නිතැතින්ම ඔප් නැංවේ. මෙසේ රටක් හෝ ජාතියක් බුද්ධි**

සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගමෙන්

# විද්‍යා විෂයයනට උපකාරක පොත් පෙළක්

| | | |
|---|---|---|
| රසායන විද්‍යාවේ මූලධර්ම 1 | මහාචාර්ය ජේ. කේ. පී. ආරියරත්න | රු. 75. 00 |
| රසායන විද්‍යා ප්‍රවේශය | එම | රු. 70. 00 |
| භෞතික රසායනය 1 (3 වන මුද්‍රණය) | මහාචාර්ය එම්. සෙල්වරත්නම් | යන්ත්‍රස්ථයි |
| භෞතික රසායනය 2 | එම | රු. 35. 00 |
| කාබනික රසායනය (සංශෝධිත 3 වන මුද්‍රණය) | ජී. පී. වන්නිගම | රු. 45. 00 |
| රසායන විද්‍යාවේ ගැටලු විසඳීම | මයිලු හා හේමා සෙල්වරත්නම් | රු. 50. 00 |
| භෞතික විද්‍යාවේ ගැටලු හා විසඳුම් - 1 කොටස | කීර්ති තෙන්නකෝන් හා විත්‍රානන්ද මල්වත්ත | රු. 25. 00 |
| ප්‍රායෝගික භෞතික විද්‍යාව (SI ඒකක සහිත 4 වන ප්‍රතිසංශෝධිත සංස්කරණය) | මහාචාර්ය සී. දහනායක | රු. 120. 00 |
| මිරිදිය මත්ස්‍ය රෝපණය | එම්. ජේ. එස්. විජයරත්න | රු. 22. 50 |
| මූලික ප්‍රවේණි විද්‍යාව | රත්නායක/කොතලාවල | රු. 120. 00 |

වී. පී. පී. එවමු.

වෙළඳ වට්ටම සහිතව වෙළඳ මහතුනට අවශ්‍ය පිටපත්ද වී. පී. පී. මගින් එවිය හැකිය. තැපැල් ගාස්තුව අමතරව අය කෙරේ.

ඇණවුම්/විමසීම්:

කළමනාකාර/ප්‍රකාශන අංශය,
සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම,
41, රාමනායක මාවත, කොළඹ 2.

ටෙලි: 35175

**වර්ධනය කරා මෙහෙය වීමෙන් ජාතික ප්‍රබෝධයක් ඇති කිරීමේ නියමුවන් ලෙස ගත් කරුවන් වෙත හිමි වන්නේ අද්විතීය ස්ථානයක් බැව් සඳහන් කළ යුතුය.**

රටට ජාතියට ගත් කරුවන්ගෙන් ඉටු විය යුතු යථෝක්ත උදාර මෙහෙවර ලබා ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු නොකරන්නේ නම් ඔවුන් සතු කුශලතා උපන් ගෙයිම මැරී යාමෙන් ජාතියටම අත්වන්නේ විශාල පාඩුවකි. ඒ අනුව **ඔවුන් සතු සැඟවුනු කුසලතා වර්ධනයටත්, පවතින කුශලතා ඔප් නැංවීමටත්, අවස්ථාවක් සලසා දීම ජාතික යුතුකමක් වන්නේය.**

පොදුවේ මෙරට පොත් ප්‍රකාශනය පිළිබඳ සලකා බැලීමේදී මෙරට නිර්මාණ සාහිත්‍යයේ බිහිවීම උදාසීන වී ඇති බව ප්‍රකට කරුණකි. **පොත් ප්‍රකාශනය හීනවීම කෙරෙහි බලපා ඇති හේතු රැසකි. කඩදාසි මිළ ඇතුළු සියලුම මුද්‍රණ කටයුතුවල මිල ඉහල යාමත්, ඊට අනුරූපව පොත් මිලයාමත්, පොත් අලෙවිය පහත බැසීමත් ඒ සඳහා බලපා ඇති මූලික සාධක වේ. මෙවැනි දුර්විපාක හමුවේ නව ලේඛකයන් හෝ නව නිර්මාණ එළි දැකීම කෙරෙහි කිසිසේත් බලාපොරොත්තු තැබිය නොහේ.**

**නිර්මාණශීලී සාහිත්‍ය කෘති බිහිවීමේ ඌණතාවය හේතුවෙන් මෙරට අනාගත පරපුර හුදු තාවකාලික වින්දනයට ඇබ්බැහිවීමේ ජාතික උවදුරට ලක් වී ඇත.** පහත් පෙළේ චිත්‍රකථා, කැසට් හා වෙනත් ශ්‍රව්‍ය – දෘශ්‍ය මාධ්‍ය මෙන්ම මත් ද්‍රව්‍ය ද ඔවුන්ගේ මනෝ ලෝකයේ තෘප්තිය සඳහා වැඩි වැඩියෙන් පරිහරණය වීමත් දක්නට ලැබේ. එපමණකුදු නොව ඒවායේ අලෙවිය සඳහා ප්‍රබල ප්‍රචාරයක් ලබා දීමත් සිදු කෙරේ.

**ජාතික වශයෙන් අප මුහුණ පා ඇති යථෝක්ත උපද්‍රවය හේතුකොට ගෙන දියුණු රටවල් හමුවේ බුද්ධිමත් ජාතියක් වශයෙන් හිස එසවීමට යත්න දැරීම "කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලීමක්" වනු හා සමාන ක්‍රියාවකි.** මෙසේ තව දුරටත් බුද්ධියෙන් මොට වූ, ශූන්‍ය වටිනාකම් අගයන ජාතියක් බවට පත්වීම වැලැක්වීම සඳහා කුමන පියවරක් හෝ යෙදීම වගකිව යුත්තන්ගේ අවධානය යොමු කළ යුත්තකි. එම ජාතික උපද්‍රවය හමුවේ තවදුරටත් නිහඬව සිටීම ප්‍රඥාගෝචර නොවන්නකි. උසස් නිර්මාණ සාහිත්‍යයක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිමක් සැකසීම ඒ සඳහා ගත යුතු එක් වැදගත් පියවරක් වේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, එක් දහස් නවසිය අසූහතර වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කොට ඇති පොත් ප්‍රකාශන වැඩ පිළිවෙල, යථෝක්ත උපද්‍රවයෙන් ජාතිය මුද ගැනීමේ පරමාර්ථයෙන් රජය විසින් ගෙන ඇති ප්‍රයත්නයක් ලෙස හඳුන්වමු. මේ අනුව **ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් නිර්මාණශීලී කතුවරුන් පොත් ලිවීම කෙරෙහිත්, හොඳ පොත් ප්‍රකාශනය සඳහා පොත් ප්‍රකාශකයින්ට අත හිත දීමක් වශයෙනුත්, ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙල සඳහා රජයෙන් 1984 වර්ෂය සඳහා රු. 25,00,000 ක මුදලක් ලබා දී ඇත.**

ග්‍රන්ථ ප්‍රකාශනය දියුණු කිරීම සඳහා මීට පෙර කිසිම කලෙක රජය විසින් මේසා විශාල මුදලක් යොදවා නැත. රටේ සියලුම අංශවල විශේෂයෙන් ආර්ථික පදනමක් ඇති ක්ෂේත්‍රවල පසුගිය අවුරුදු කීපයක් තුළම **රජය විසින් ක්‍රියාත්මක කර ඇති මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපාර වලට නොදෙවෙනි ශාස්ත්‍රීය සංවර්ධන වැඩ පිළිවෙලක ආරම්භය වශයෙන් මෙම ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය හඳුන්වා දීමට කැමැත්තෙමු.** එම වැඩ පිළිවෙල මේ රටේ අභාවයට යමින් ඇති සාරධර්ම හා සංස්කෘතික පදනම යළි ගොඩ නැගීමට හේතුවන මූලික කටයුත්තක්ය. ග්‍රන්ථ නිෂ්පාදනය වෙළඳ ව්‍යාපාරයක් බව සැබෑය. එහෙත් එහි මූලික පරමාර්ථය විය යුත්තේ මොනයම් හෝ දෙයක් ලියා මුද්‍රණය කොට මුදල් කිරීම නොවේ. **මිනිසුන්ගේ මානසික, ශාස්ත්‍රීය තාක්ෂණික හා සුචරිත වර්ධනය ඕනෑම විශිෂ්ඨ ජාතියක විද්‍යමාන වන සම්පත්ය. ග්‍රන්ථ කර්තෘවරුන් හා ප්‍රකාශකවරුන් විසින් අරමුණු කොටගත යුත්තේ මෙම සම්පත් සංවර්ධනයයි. ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අපේක්ෂාව වනුයේ මෙම අරමුණ පෙරදැරි කරගත් කර්තෘවරුන්ට හා ප්‍රකාශකවරුන්ට අතදීමය.**

## ළමා පුස්තකාලයක් විවෘත වේ.



ගරු අගමැති **ආර්. ප්‍රේමදාස** මහතා අතින් මහනුවර ළමා පුස්තකාලය විවෘත කළ අවස්ථාව. ගරු කථානායක **ඊ. ඇල්. සේනානායක**, මහනුවර පුරපති **තිලක් රත්නායක** යන මහතුන් සමග පුස්තකාලයාධිපතිනිය **ඩී. රත්නායක** මහත්මියද ඡායාරූපයේ වෙති.

# මණ්ඩලීය කටයුතු 1983

## ප්‍රතිග්‍රහණ අංශය

### පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීම

අදාල වර්ෂය තුලදී ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් වැදගත් ග්‍රන්ථ, සඟරා හා පර්යේෂණ සඳහා අවශ්‍ය **රාජ්‍ය ප්‍රකාශන වාර්තා, ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, අත්ලිපි** යනාදිය මිලදී ගැනීම සඳහා කටයුතු කරන ලද අතර, ඒ සඳහා වැය කරන මුළු මුදල රුපියල් ලක්ෂ හයකි.

**ඔස්ට්‍රේලියාව, ජපානය, සෝවියට් දේශය, ඇතැම් යුරෝපීය හා ආසියාතික** රටවල් සමග පොත් හුවමාරු කර ගැනීමේ වැඩ පිළිවෙල යටතේ වර්ෂය තුලදී රුපියල් 20,000/- වටිනා විදේශීය පොත් නොමිළයේ ලබා ගැනීමට කටයුතු කරන ලදී.

දේශීය පුස්තකාල, ආයතන හා පුද්ගලයින් වෙතින් මෙම වර්ෂය තුලදී රුපියල් 50,000/-ක් පමණ වටිනා පොත් කාණ්ඩ 4695ක් ජාතික පුස්තකාල එකතුව සඳහා පරිත්‍යාග වශයෙන් ලබා ගැනීමටද පියවර ගන්නා ලදී.

### තොරතුරු සැපයීම

දේශීය විශ්ව විද්‍යාල හා වෙනත් ප්‍රධාන පුස්තකාල සඳහා අවශ්‍ය විදේශීය පොත්පත් හා තොරතුරු සැපයීමේ කාර්යයන් සඳහා ද මෙම අංශය කටයුතු කරන ලදී.

### ජාත්‍යන්තර ප්‍රමිති කටයුතු:

මෙරට පුස්තකාල කටයුතු නූතන ශිල්පීය ක්‍රම අනුව නවීකරණය කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධානවල සහයෝගය ඇතිව කටයුතු කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිති අනුව, පොත් ප්‍රකාශනය, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සැපයීම, පුස්තකාල අධ්‍යාපනය දියුණු කිරීම, පුස්තකාල සේවා සංවිධානය කිරීම මීට ඇතුළත් වේ.

## සංරක්ෂණ අංශය

### ග්‍රන්ථ සංරක්ෂණය:

ජාතික පුස්තකාලයේ රැස්කොට ඇති ලක්ෂයක් පමණ වටිනා ග්‍රන්ථ සම්භාරය සංරක්ෂණය සඳහා රු. **1,15,000** ක් වැය කරන ලදී. මෙම වර්ෂය තුලදී ග්‍රන්ථ **2148**ක් බැඳීමට කටයුතු කර ඇත.

## පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය

### පුස්තකාල සංවර්ධනය සඳහා පොත් ආධාර සැපයීම

පුස්තකාල සේවා සංවර්ධන ක්‍රියාවලියෙහි පොත් පත් හිඟකම දිවයිනේ බොහෝ පුස්තකාල මුහුණ පාඇති ගැටළුවක්ව පවතින බැවින්, මණ්ඩලය වෙත පොත් ආධාර සඳහා ලැබී ඇති ඉල්ලීම් පිළිබඳව 1983 වර්ෂයේ කරන ලද සමීක්ෂණයක් පදනම් කරගෙන වඩාත් ක්‍රමානුකූලව පොත් පරිත්‍යාග කිරීමට කටයුතු යොදන ලදී. එංගලන්තයේ **රන්ෆර්ලි පුස්තකාල සේවාව** හා **ඕ.ඩී.එම්.** පොත් ආධාර ක්‍රමය යටතේ මණ්ඩලය වෙත ලැබී ඇති ඉංග්‍රීසි පොත් පත් සහ කර්තෘ ප්‍රකාශක ක්‍රමය යටතේ මණ්ඩලය විසින් මෙම වර්ෂයේ මිළදී ගන්නා ලද පොත් ද මෙම පරිත්‍යාග ලෙස ලබා දෙන ලදී. පොත් පරිත්‍යාග වැඩ පිළිවෙල යටතේ විවිධ වර්ගයේ පුස්තකාල **105** ක් සඳහා පරිත්‍යාග කරන ලද මුළු පොත් සංඛ්‍යාව **4656** ක් වන අතර, එහි මුළු වටිනාකම **රු. 64,153.22 ක්** වේ. මෙතෙක් මණ්ඩලය විසින් පොත් ආධාර වශයෙන් ලබා දී ඇති උපරිම ප්‍රමාණය මෙය වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පුස්තකාල වර්ග | ආයතන සංඛ්‍යාව | පොත් සංඛ්‍යාව | වටිනාකම රු. ශත |
|---|---|---|---|
| පාසැල් පුස්තකාල | 39 | 2022 | 54,990.87 |
| මහජන පුස්තකාල | 39 | 1713 | 30,832.49 |
| රජයේ දෙපාර්තමේන්තු ප්‍රජා මණ්ඩල හා වෙනත් | 17 | 903 | 8,329.86 |

### පුස්තකාල සංවිධානය සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම

අභිනවයෙන් පුස්තකාල ආරම්භ කිරීමේදීත්, පවතින පුස්තකාල ව්‍යාප්ත කිරීමේදීත්, පුස්තකාලයන්හි **අභ්‍යන්තර සංවිධාන** කටයුතු හා ඒවා සඳහා **අවශ්‍ය ලී බඩු ප්‍රමාණයන් හා සැලසුම්** සැපයීමද, **පුස්තකාල සේවා කටයුතු ප්‍රතිසංවිධානය කිරීම** පිළිබඳ වාර්තා අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීමත්, මෙම වර්ෂය තුල සිදු කරන ලදී. මේ යටතේ සේවාවන් සපයන ලද විවිධ වූ පුස්තකාල සංඛ්‍යාව **16** ක් වේ. තවද විවිධ පුස්තකාල මගින් පවත්වන ලද ව්‍යාප්ත සේවා කටයුතු සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීමට කටයුතු යෙදීමත් සිදු කරන ලදී.

### යුනිසෙප් ආධාර යටතේ පාසැල් පුස්තකාල සංවර්ධනය

යථෝක්ත වැඩ පිළිවෙල යටතේ **අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේද** සහයෝගය ඇතිව ගුරු පුස්තකාලයාධිපතීන් **31** දෙනෙකු සඳහා **ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී නේවාසික පුහුණු පාඨමාලා 2ක් සංවිධානය කරන ලදී.** 1983.06.21 සිට 1983.06.27 දක්වාත්, 1983.11.06 සිට 1983.11.11 දක්වාත් එම පාඨමාලා පවත්වන ලදී. එහි ප්‍රථම පාඨමාලාව ආරම්භයේ පැවැත්වූ සම්මන්ත්‍රණය සඳහා දිවයිනේ පොකුරු පාසැල්හි විදුහල්පතිවරු හා කොළඹ දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරු රාශියක් සහභාගි කරවා ගැනීමට කටයුතු යොදන ලදී. මේ සඳහා දළ වශයෙන් වැය වූ මුළු මුදල **රු. 50,000.00 කි.**

### පුස්තකාල ලිපි ද්‍රව්‍ය අලෙවිය

පුස්තකාල සඳහා අවශ්‍ය **පරිග්‍රහණ ලේඛන, දින පත්‍රිකා, පොත් කුණ්ඩු, පාඨක බලපත්‍ර,** සඳහා පවතින අධික ඉල්ලුම් අනුව ඒවා මුද්‍රණය කොට රජයේ හා වෙනත් ආයතනික පුස්තකාල රැසක් සඳහා සහන මිලකට අලෙවි කරන ලදී. මෙම ලිපි ද්‍රව්‍ය මණ්ඩලයේ පුස්තකාල සංවර්ධන ආධාර වශයෙන් ද ඇතැම් පුස්තකාල වෙත පරිත්‍යාග වශයෙන්ද ලබා දෙන ලදී.

(8 වන පිටුවට)

# මහජන පුස්තකාල පාඨක සමාජ

## ජී. එම්. පුංචිබණ්ඩා

පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

**කලක් අගනුවරට හා දිවයිනේ ප්‍රධාන නගර කිහිපයකට පමණක් සීමා වී තිබූ මහජන පුස්තකාල සේවය අද ශ්‍රී ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකම පාහේ ක්‍රියාත්මක වන සේවයක් බවට පත්වෙමින් පවතී. පසුගිය දශක දෙක තුනක කාලය තුළ මහ නගර සභා, සුළු නගර සභා හා ගම් සභා වැඩි ප්‍රමාණයක මහජන පුස්තකාල ආරම්භ කර ඇත.**

පළාත් පාලන සේවයේ නව යුගයක් උදා කරමින් ඇරඹුනු සංවර්ධන සභා ක්‍රමය ජාතික මට්ටමේ මහජන පුස්තකාල පද්ධතියක් (Public Library System) ගොඩ නැංවීමට දැමූ ශක්තිමත් පදනමක් වී ඇත. අනාගත ජාතික පුස්තකාල සංකීර්ණයක (National Library Complex) ක්‍රියාකාරී මහජන පුස්තකාල පද්ධතියක් ඇති කිරීම සඳහා සංවර්ධන සභා ක්‍රමය පැහැදිලි පසු බිමක් සකස් කොට ඇත. ජාතියේ මහා බුද්ධි මන්දිරය වන **"ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය"** ඉදි වෙමින් පවතින මේ යුගයේ එහි ආලෝකය පොදු ජනතාව කරා ගෙන යන නියමුවෙක් වන "මහජන පුස්තකාල" සඳහා මඟ සලකුණු සංවර්ධන සභා ක්‍රමය මගින් පැහැදිලිව සටහන් කර ඇත.

### වගකීම:

මෙබඳු පසුබිමක වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමේ වගකීම පුස්තකාලයාධිපති කෙරෙහි පැවරී ඇත. මහජන පුස්තකාල සේවය වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වෙමින් පවතී. මෙය වඩාත් ඵලදායී සේවයක් බවට පත් කිරීමේදී පුස්තකාලයාධිපතිට සහාය වන පිරිසක් ළඟා කර ගත හැකිය. මෙපමණක් නොව මහජන පුස්තකාලය පොදුජන ආයතනයකි. එය ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනයට පමණක් සීමා විය යුතු නොවේ.

අගනුවරින් ඈත් වූ නගරවලත්, ගම්වලත් ජනතාවගෙන් වැඩි පිරිසක් බොහෝ විට පුස්තකාලය ගැන නොසිතන අයයි. පාසැල් වියේදී ඒ ඒ විභාග සඳහා අවශ්‍ය පාඨ ග්‍රන්ථ හැරුණු විට විනෝදය සඳහා නව කථාවක් හෝ කෙටි කතාවක් සමහර විට කියවනු දැකිය හැකිය. පාසැල් විය අවසන් වන විට කියවීමද ඉන් අවසන් වේ. පොදුවේ ජනතාව ගත් විට කියවන එකම දෙය දිනපතා පුවත්පත පමණි. චිත්‍ර කථා පත්‍රයක්, සඟරාවක් වැනි දෙයක් ඉඳ හිට කියවනු දැක ගත හැකිය. **මින් පැහැදිලි වන්නේ ජනතාව කියවීමට අකමැති පිරිසක් බව නොවේ. හොඳ පොත පත ප්‍රකාශනය හීනවීමත්, පොත් මිළ ඉහළ යාමේ හේතුවෙන් පොත් අලෙවිය අඩු වී ඇති බවත් මෑතකදී ශ්‍රී ලංකාවේ පාඨක ජනතාව, කියවීමේ රුචිය හා ග්‍රන්ථ අලෙවිය පිළිබඳව කරන ලද සමීක්ෂණවලින් හෙළි වී ඇත.**

ඉහත සඳහන් කළ කරුණු අනුව අපගේ අවධානය පුස්තකාලය වෙත යොමු කිරීම කාලෝචිත වේ. ජනතාවට කියවන දෑ ලබාදීම පුස්තකාලයාධිපතින්ගේ යුතුකමක්, වගකීමක්. පොත්පත් මිලදී ගෙන පුස්තකාලයක තැන්පත් කළාට මෙම යුතුකම ඉටු වන්නේ නැත. පුස්තකාලය එක පැත්තක. ජනතාව තවත් පැත්තක. මේ දෙකොටස එක් කිරීමකින් තොරව පුස්තකාලයෙන් සමාජ සේවයක් සිදු විය නොහැක. ජනතාව පුස්තකාලයට ළඟා කරවිය යුතුය. ඒ සඳහා පුස්තකාලයත් ජනතාවත් ඒකාබද්ධ කරන පුරුකක් ලෙස පාඨක සමාජ ඇති කළ හැකිය.

### පාඨක සමාජ:

**මහජන පුස්තකාලයන්හි පාඨක සමාජ ආරම්භ කිරීම සඳහා මනා පසුබිමක් දැන් සකස් කර ඇත. එක් අතකින් පළාත් පාලන ක්‍රමයේ නව පිළිවෙත් මගින් ආරම්භ කරන ලද ග්‍රාමෝදය මණ්ඩල සංවර්ධන සභා ක්‍රමය තුළින් පාඨක සමාජ නියෝජනය සඳහා අවස්ථාව ලබා දී ඇත. තවත් අතකින් පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍ර ලේඛ මාර්ගයෙන් පාඨක සමාජ ඇති කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දී ඇත. මේ නිසා මීට පෙර ක්ෂේත්‍රයේ නොවූ විරූ උද්යෝගයක් සඳහා ද ඉඩ සැලසී ඇත. කොළඹ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත අභ්‍යන්තර චක්‍ර ලේඛයක් නිකුත් කරමින් පුස්තකාල පාඨක සමාජ පිහිටු වීම අවශ්‍යම කාර්යයක් ලෙස සඳහන් කර ඇත.**

මහජන පුස්තකාලයක පාඨක සමාජයක් පිහිටුවීමේදී පුස්තකාලයාධිපති එහි සංවිධායක වශයෙන් නියුක්ත වීම වැදගත් වේ. පළාත් පාලන ආයතනයේදී සංවර්ධන සභා උප කාර්යාලයේ නිලධාරීන්ගේ විශේෂයෙන් පළාත් පාලන නිලධාරී, විශේෂ කොමසාරිස්, පාලන නිලධාරී වැනි එම ආයතනයේම රාජකාරි කටයුතු වල නියුක්ත නිලධාරීන්ගේ සහාය ලබා ගෙන පාඨක සමාජ ආරම්භ කළ හැකිය. පුස්තකාලයේ ලියාපදිංචි වී සිටින සියළුම පාඨකයින්ට හා නිතර පුස්තකාලය හා කියවීම් ශාලාව ගැන උනන්දු වන පාඨකයින්ට ආරාධනා කොට මූලික රැස්වීම් පවත්වා පාඨක සමාජයේ කටයුතු නිගමනය කළ හැකිය. ඒ සඳහා අවශ්‍ය නිලධාරී මණ්ඩලයක් ද පත් කර ගත හැක.

කාර්යාලයේ නිලධාරීන් හා පුස්තකාලයාධිපති අනුශාසකවරු වශයෙන් සිටිය යුතු අතර පාඨක සමාජ අක්‍රිය වීමට ඉඩ නොදී එය ක්‍රියාත්මක ස්වරූපයෙන් පවත්වාගෙන යාමේදී ක්‍රියාකාරී සංවිධායකගේ වගකීම ඔවුන් සතු වේ. විශේෂයෙන් සමාජය ක්‍රියාකාරී මගට යොමු කිරීමේ හැකියාව හා වගකීම අනිවාර්යයෙන් පුස්තකාලයාධිපති සතු වන බව අමතක

කළ යුතු නොවේ. පාඨක සමාජයේ බලතල ලත් නිලධාරි පිරිස පාඨකයින්ගේ සිතු මනාපය පරිදි ඔවුන් අතරින්ම තෝරා ගැනීමට අවස්ථාව ලබා දිය යුතුය.

## ක්‍රියාත්මක භාවය:

පුස්තකාලයක ක්‍රියාශීලී භාවය ඇති කිරීම සම්බන්ධයෙන් පුස්තකාලයාධිපතිට සහයෝගය දෙන ආයතනයක් ලෙස පාඨක සමාජයට කටයුතු කළහැකි අවස්ථා කොතෙකුත් ඇත. ඉන් කිහිපයක් දැන් සාකච්ඡා කරමු.

පොත්පත් තේරීමේ පටන් පුස්තකාලයේ සම්පත් සංවර්ධනය, මුදල් පරිහරණය, කාර්ය මණ්ඩලය පත් කර ගැනීම සහ සාර්ථක පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යාම සඳහා උපදෙස් ලබා ගැනීම පිණිස උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබේ. මේ උපදේශක මණ්ඩලයට පාඨක සමාජයේ නියෝජිතයන් ද ඇතුළත් කර ගත හැකිය. ඒ මගින් පාඨක සමාජයේ අදහස් කෙළින්ම උපදේශක මණ්ඩලයේ නියෝජනය වීම නිසා වඩා ක්‍රමවත් සේවයක් ලබාදිය හැකි වෙයි. තව ද බාහිර ආයතනයක වුවද පුස්තකාලයේ අභ්‍යන්තර කටයුතුවලට සහාය ලබා ගත හැකි වේ.

**පුස්තකාලයට පොත් තේරීමේ පටන් එම පොත් පාඨකයන් අතට පත් කිරීම දක්වා සියළු කාර්යයන්හිදී පාඨක සමාජයේ සහාය ලබාගත හැකියි. පොත් තේරීමේදී තම පුස්තකාලයට වඩා සුදුසු කුමන පොත්ද යන්න පිළිබඳ තීරණය කිරීමේදී පාඨක සමාජයේ අදහස් ඉතාමත් වැදගත් වේ.**

තම බල ප්‍රදේශය තුළ සියලුම මහජන පුස්තකාල සඳහා පොත් තේරීම, මිළදී ගැනීම හා නිමැවුම් කිරීම දිස්ත්‍රික් සංවර්ධන සභාව විසින් මධ්‍යගත කිරීමට පියවර ගෙන ඇත. මේ ක්‍රමය බටහිර පුස්තලයන්හි ක්‍රියාත්මකවන සාර්ථක අත් දැකීමක් වන මධ්‍යගත ප්‍රතිග්‍රහණ ක්‍රමය (Central Acquisition Policy) මෙරටට හඳුන්වා දීමකි. ආරම්භයේදී ඇතිවන ක්‍රියාත්මක කරවීමේ අඩුපාඩු නිසා මේ ක්‍රමය අපේ රටේ ඇතැම් මහජන පුස්තකාලයාධිපතිවරුන්ගේ දෝෂ දර්ශනයට ලක වී ඇත. මේ අනුව පාඨක අවශ්‍යතා අනුව පොත් තේරීමක් සිදු නොවීම, අනවශ්‍ය ලෙස ඇතිවන ප්‍රමාදය වැනි චෝදනා අසන්නට ලැබේ. පොත් තේරීමේදී දිස්ත්‍රික් පුස්තකාල කමිටුවට පාඨක නියෝජිතත්වය ලබාදීම මෙයට හොඳම විසඳුමකි. මේ සඳහා පාඨක සමාජයේ ක්‍රියාත්මක සහභාගිත්වය අවශ්‍ය වෙයි.

මෙරට මහජන පුස්තකාල මුහුණ පාන තවත් ප්‍රශ්නයකි, අවශ්‍ය සම්පත් හිඟකම. මුදල්, ගොඩනැගිලි, පොත්පත්, උපකරණ හා කාර්ය මණ්ඩලය අවශ්‍ය තරම් නොමැතිකම. ග්‍රාමීය මට්ටමේ සංවර්ධන කටයුතු වලදීත්, නාගරික සංවර්ධනයේදීත් සංවර්ධන සභා සහ අනෙකුත් පළාත් පාලන ආයතනයන්හි වැඩි අවධානය පුස්තකාලවලට වඩා භෞතික වශයෙන් පෙනෙන සංවර්ධන කටයුතු කෙරෙහි යොමුවනු පෙනේ. ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍යය, මංමාවත්, ජලය, විදුලිය, මෙන්ම අධ්‍යාත්මික දියුණුවටත් භෞතික සංවර්ධනයටත් අවශ්‍ය දැනුම ලබා ගැනීම සම්බන්ධයෙන් පුස්තකාල සේවාව අත්‍යවශ්‍ය වෙයි. මේ කෙරෙහි වගකිව යුත්තන්ගේ අවධානය යොමු කරවනුවස් විශාල වැඩ කොටසක් පාඨක සමාජය මගින් සිදු කළ හැකිවෙයි.

## සමීප සම්බන්ධතා:

**පාඨකයන් හා සුහදතාවය වඩා සමීපව පවත්වාගෙන යාමට පාඨක සමාජය ප්‍රයෝජනවත් වේ. පුස්තකාලය ජනතාව සමග සිටින ජනතාවට නිතර ළඟා විය හැකි ආයතනයකි. මේ තත්ත්වය රැක ගැනීමට ජනතාවගේ සමීප සුහදතාවය පුස්තකාලයාධිපතිට ලබා ගැනීමට පාඨක සමාජය ඉතාම වැදගත්ය. එමගින් පුස්තකාල අපේය යන හැඟීම පාඨකයාට ලබා දිය හැකිය.**

පුස්තකාලයාධිපතිට මුහුණ දීමට ඇති තවත් ප්‍රශ්නයක් නම් පොත්පත් නැතිවීම, පොත්වල කොළ කැඩීම, පිටු ඉරීම, ඉරි ඇඳීම වැනි හානි කර ක්‍රියා හා පුවත්පත් සඟරා ආදියේ කොටස් සොරකම් කිරීම, ග්‍රන්ථ පරිහරණයේදී අර පරෙස්සමක් නැතිකම. පාඨක ආකල්පයන්හි වෙනසක් ඇති කිරීම මේ තත්ත්වයට පිළියමක් වේ. පාඨකයා එවිට පුස්තකාලය තම සම්පතක් ලෙස ආරක්ෂා කරනු ඇත. පාඨකයින්ට ග්‍රන්ථ නිකුත් කිරීමේදී ඉවසීමෙන් කළ හැකිය. කවුන්ටරයේ එක් නිලධාරියෙක් පමණක් සේවය කරන අවස්ථාවේදී ඇතිවන තදබදය නිලධාරියාට අවහිරයක් කරදරයක් නොවන පරිදි කටයුතු කිරීමට පාඨකයා හා පුස්තකාලය අතර සමීප සුහදතාවය හේතු වනු ඇත.

ඒ අනුව පුස්තකාලයේ විමර්ශන අංශයේ, කියවීම් ශාලාවේ මෙන්ම පොදුවේ පුස්තකාලය තුළ නිශ්ශබ්දතාවය හා විනය ගරුකත්වය ආරකෂා කිරීමට දැන්වීම්, පෝස්ටර් හා නීති පද්ධති මගින් කරන බලපෑම්වලට වඩා සාර්ථක ලෙස පාඨක සුහදතාවය උපයෝගී කරගත හැකිය. මේ අයුරින් පුස්තකාල පාඨක සමාජ වැදගත් වේ.

පුස්තකාලයක සේවාව ගොඩනැගිල්ල තුළට පමණක් සීමා නොවීම අද එහි විශේෂ ලක්ෂණයකි. අපේ රටේ පුස්තකාල තවමත් ජනතාවගේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව නැත. එනිසාම ජනතාව හා පුස්තකාල අතර පරතරය විශාලව පවතී.

මේ තත්ත්වය නැති කිරීමට යොදා ගත හැකි එක් මාර්ගයක් නම් ජනතාව වෙත දැනුම ගෙන යන විස්තෘත සේවාවන් සංවිධානය කිරීමයි. පුස්තකාල විස්තෘත සේවා සංවිධානය කිරීමේදී එක පුද්ගලයෙකුට එනම් පුස්තකාලයාධිපතිට පමණක් කළ නොහැකි දෙයක් පාඨක සමාජයට කළ හැකිය. අපේ රටේ පවත්නා ආර්ථික දුෂ්කරතා හා අනෙකුත් අඩුපාඩු නිසාම ජනතාවට අවශ්‍ය දැනුම ලබාදීමට නොහැකි අසරණ තත්ත්වයක මහජන පුස්තකාලය අද පසුවේ. පාඨක සමාජයේ ක්‍රියාකාරිත්වයෙන්, ඔවුන්ගේ ශ්‍රමයට වැඩි වටිනාකමක් දෙමින්, සංවිධාන ශක්තියට අගයක් දෙමින් විස්තෘත සේවාවන් පවත්වා ගෙන යා හැකිය.

සාහිත්‍ය උත්සව ජාතික උත්සව හා ආගමික උත්සව සංවිධානය කිරීම එක් විස්තෘත සේවාවකි. සාහිත්‍ය සතිය සමරනු පිණිස උත්සව සංවිධානය කිරීම ජාතියේ ඥාණ සම්භාරයට කරන ප්‍රණාමයක් පමණක් නොව ජනතාව පිබිදු වීමක් ද වේ. සිංහල අවුරුදු උත්සවය වැනි ජාතික උත්සව, වෙසක්, පොසොන් හා නත්තල් වැනි ආගමික උත්සව සංවිධාන කටයුතු මගින් ජනතාව එත් පිළිවෙත් වලට යොමු කරවීමෙන් ජාතියේ ශික්ෂණය ඇති වන අතරම පාඨක සමාජ මෙයට මැදිහත් වීම ජනතාව පුස්තකාල වෙත ඇද ගැනීමක් වේ.

වරින් වර විශේෂ දේශකයින් ගෙන්වා දේශණ පැවැත්වීම, චිත්‍රපට දර්ශණ පැවැත්වීම, සාකච්ඡා සභා, වාද විවාද, නාට්‍ය සංදර්ශණ, සංගීත සංදර්ශන වැනි දේවල් සංවිධානය කිරීම මෙන්ම පාඨකයන් අතර තරඟ පැවැත්වීම පාඨක සමාජයට සංවිධානය කළ හැකි වේ. ගී තරඟ, ප්‍රබන්ධ හා රචනා තරඟ නාට්‍ය තරඟ මෙන්ම ක්‍රීඩා තරඟ වලට මැදිහත්ව කටයුතු කිරීම කළ හැකිවේ. භක්ති ගීත සංදර්ශණ වැනි ආගමික සංදර්ශණයන් ජනතාව තුළ පිබිදීමක් ඇති කරවයි. නත්තල් සැරසිලි වෙසක් සැරසිලි හා සරුංගල් තරඟ වැනි ළමා මනස පුබුදුවන වැඩ සටහන් සංවිධානය කිරීමට ද පාඨක සමාජයට හැකියාව ඇත.

## නියමුවා:

ඉහතින් දක්වන ලද විස්තෘත සේවාවන් වලදී පාඨක සමාජ සංවිධාන කටයුතු භාරව ක්‍රියා කරන අතරම තවත් අවස්ථාවකදී එම පාඨක සමාජ ජනතා අවශ්‍යතාවයන්ට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කළ හැකිය. ප්‍රදේශයේ ජනතා සෞඛ්‍යයට සම්බන්ධ වැඩ කටයුතුවල දී ආර්ථික සංවර්ධන කාර්‍යයන්හිදී ජාතික, ආගමික පොදු කටයුතු වලදී අධ්‍යාපන කටයුතුවලදී ලුහුඬින් කියතොත් පොදු ජනතාවට අවශ්‍ය සැම කාර්‍යයකටම සහාය විය හැකි ආයතනයක් ලෙස පාඨක සමාජයක් සංවිධානය කළ හැකිය. නූතන "පුස්තකාල" යන සංකල්පය ජීවිතයේ අත්‍යාවශ්‍ය අංගයක් කිරිංමේදී එහි නියමුවා ලෙස පාඨක සමාජය ක්‍රියාත්මක විනු ඇත. පුස්තකාලය ජනතා අවශ්‍යතා සපුරාලන ජනතාවගේ එදිනෙද ජීවිතයේ නැතිවම බැරි අංගයක් ලෙස පවත්වාගෙන යාමට පුස්තකාලයාධිපති දරණ උත්සාහය සපුරා ලීමට පාඨක සමාජ උපයෝගී කරගත හැකිය.

**සංවර්ධන සහා ක්‍රමය නිසා මෑත යුගයේ පළාත් පාලනයේ ඇති කරන ලද වෙනස් කම් තුලින් පුස්තකාලය ජනතාවට සම්බන්ධ වීමට තවත් මගක් උද කර ඇත. පාඨක සමාජය ස්වේච්ඡා සංවිධානයක් ලෙස ගම තුළ ක්‍රියාත්මක වීමේදී ග්‍රාමෝදය මණ්ඩලයේ නියෝජිතයෙක් වීමට අවස්ථාවක් ලැබෙනු ඇත. එය ගමේ පාලනයට පාඨක සමාජය සම්බන්ධ වීමකි.**

ග්‍රාමෝදය මණ්ඩලය සංවර්ධන සභාවටත් දිස්ත්‍රික් සංවර්ධන සභාවටත් යැවීමේදී ක්‍රියාකාරී පාඨක සමාජයක නියෝජනත්වය මඟ හැරිය නොහැකිය. මින් අදහස් වන්නේ දිස්ත්‍රික් සංවර්ධන සභාවට පවා පාඨක සමාජය නියෝජනය වීමේ හැකියාවක් ඇති බවයි. එනිසාම සංවර්ධන සභාවෙන් ප්‍රදේශයේ මහජන පුස්තකාලයට ලැබිය හැකි උපරිම සහයෝගය එයින් ලබා ගත හැකිය. වෙනත් වචනයෙන් කියතොත් ප්‍රාදේශීය පාලනයට පුස්තකාලයේ නියෝජිතයෙක්ද සහභාගිවීම මේ නිසා සිදුවේ.

ඉහත දක්වන ලද ආකාරයට ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට, ජාතික සංවර්ධනයට ජනතාව සහභාගී කරවා ගැනීමේදී මහජන පුස්තකාල එයට සහාය කරවා ගැනීමට පාඨක සමාජ ක්‍රියාශීලී නියමුවෙක් ලෙස කටයුතු කරනු ඇත.

**ජාතික පුස්තකාලයෙන්**
**විශේෂාංගය මෙවර පළ නොවේ.**


# පුස්තකාල විද්‍යාර්ථීන්ගේ දැනුම වඩන ප්‍රකාශන පෙළක්

❊ **Catalogue of Postgraduate Dissertations;**
Available in the University and Research Libraries of Sri Lanka.
*Comp. by N. Amarasinghe* **Rs. 74.00**

❊ **මූලික සූචිකරණය**
ග්‍රන්ථ සූචිකරණයේ මූලධර්ම හා මූලික සූචිකරණ ව්‍යවස්ථාවන් සරල අයුරින් ඉදිරිපත් කරයි.
ධනපාල ගුණසේකර **රු. 37.00**

❊ **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**
**இலங்கைத் தேசிய நூற்பட்டியல்**
Sri Lanka National Bibliography
Annual Subscription **Rs. 80.00**

❊ **මහජන පුස්තකාල ප්‍රමිති**
සිංහල සංස්කරණය **රු. 4.00**

❊ **මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය**
(නාමාවලියකි) **රු. 12.00**

මුදල් හෝ තැපැල් ඇණවුම්, චෙක්පත්
**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**
නමට ලියනු මැනවි
විමසීම් හා ලිපි:
අධ්‍යක්ෂ/ලේකම්
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**
තැ. පෙ. 1764, නිදහස් මාවත
කොළඹ 7. ටෙලි: 598847.


**පුස්තකාල තොරතුරු**
**සිදුවීම් හා විශේෂාංග**
**පුස්තකාලයාධිපතිගේ සහතිකය**
**සමඟ යොමු කරන්න.**
**පහත ලිපිනයට:**

**අධ්‍යක්ෂ/ලේකම්**
**පුස්තකාල සේවා මණ්ඩලය**
නිදහස් මාවත, කොළඹ 7.
ටෙලි: 598847

## මණ්ඩලීය කටයුතු. . . (4 වන පිටුවෙන්)

**පොත් පිරුළු සේවා**

පාසැල් ළමුන් අතර කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම සඳහාත්, පාසැල් පුස්තකාලයන්හි පවතින පොත් හිඟතාවයට පිළියමක් වශයෙනුත්, පොත් පිරුළු සේවාව යටතේ තෝරා ගත් පාසැල් පුස්තකාල කිහිපයක් අතරේ මණ්ඩලය මගින් පොත් කට්ටල බෙදා හැරීමත් මෙම වර්ෂයේදී සිදු කරන ලදී. **කොලොන්නාව, කෝට්ටේ හා මැද කොළඹ මැතිවරණ කොට්ඨාශයන්හි පාසැල් 46 ක්** අතරේ මෙම පහසුකම් ලබා දෙන ලදී.

**කතෘ ප්‍රකාශක ආධාර වැඩ පිළිවෙල**

පොත් ප්‍රකාශනය සඳහා කතෘන් දිරි ගැන්වීම යථෝක්ත වැඩ පිළිවෙලෙහි මූලික පරමාර්ථය විය. ඒ අනුව අදාල වර්ෂය තුලදී නව ප්‍රකාශන මිලදී ගැනීමෙන් කතුවරුන් **125**කට ආධාර කරන ලදී. මේ සඳහා වැය වූ මුදල දළ වශයෙන් රු. 98,000කි.

**විවෘත විශ්ව විද්‍යාල පහසුකම්**

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය හා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය** අනුබද්ධව ක්‍රියාත්මක කරනු ලබන උක්ත වැඩ පිළිවෙල යටතේ **දිස්ත්‍රික් පුස්තකාල** 10 ක් අතරේ, රු. **12,9571.95** වටිනා ග්‍රන්ථ **1162** ක් බෙදා හැරීමට කටයුතු කරන ලදී.

**මණ්ඩලීය ප්‍රකාශන**

**පුස්තකාල ප්‍රවෘත්ති** කලාප 3ක් මෙම වසරේ පළ කිරීමටත්, ඒ සඳහා පුළුල් වශයෙන් පුස්තකාල විද්‍යාර්ථීන් කාර්මික පුස්තකාල හා සියලුම මහජන පුස්තකාලයන්හි දයකත්වය ලබා ගැනීම හා අදල කලාප බෙදා හැරීමටත්, කටයුතු යොදන ලදී. මීට අමතරව පහත සඳහන් කෘති ප්‍රකාශනයට පත් කර පුළුල් ලෙස අලෙවි කිරීම සඳහාද කටයුතු යොදන ලදී. මීට අමතරව පහත සඳහන් කෘතිද ප්‍රකාශයට පත් කර ඇත.

1. **මූලික සූචිකරණය — ටී. ඩී. ඩී. ගුණසේකර.**
2. Catalogue of Postgraduate Dissertations; Available in the University and Research Libraries of Sri Lanka – Comp. by N. **Amerasinghe**

## පුස්තකාල අධ්‍යාපන අභ්‍යාස අංශය

1983 වසරේදී පුහුණු පාඨමාලා සහ සම්මන්ත්‍රණ **15** ක් පවත්වන ලදී. මෙම පාඨමාලාවට සහභාගි වූ පුස්තකාලයාධිපතින්ගේ සංඛ්‍යාව **597** ක්වේ.

**පුස්තකාල විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව**

පුස්තකාල අධ්‍යාපනික හෝ පුහුණුවීම් පහසුකම් නොමැතිව, දිවයිනේ ඈත පළාත්වල සේවය කරන, විවිධ ක්ෂේත්‍රවල පුස්තකාලයාධිපතින් විද්‍යානුකූලව පුහුණු කරලීම සඳහා වන මෙම පාඨමාලාව **1983.03.31 වන දින ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී. මේ සඳහා ලියා පදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 42කි. උසස් වෘත්තිය සුදුසුකම් සහිත, වෘත්තීය පුස්තකාලයාධිපතින්ගේ සහාය පාඩම්මාලා ලිවීම සඳහා ලබා ගන්නා ලදි. සංස්කරණය කරන ලද එම පාඩම්මාලා සහ අතිරේක කියවීම් ද්‍රව්‍ය ප්‍රමාණය 52 ක් ද, දේශන 35 ක් අඩංගු කැසට් 26 ක්ද සිසුන් වෙත යවන ලදි. ශිෂ්‍යයින් ලවා නිබන්ධන 8 කට පිලිතුරු සපයා ගනු ලැබූ අතර සියළුම ශිෂ්‍යයින් කැඳවා සම්මන්ත්‍රණ 2 ක් පැවැත්වීමටත් කටයුතු කරන ලදි.**

**මහජන පුස්තකාලයාධිපතින් පුහුණු කිරීම**

ග්‍රාමීය අංශයේ යහපත් තොරතුරු සැපයීමේ කටයුතු වර්ධනය කරලීම සඳහා මහජන පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු පාඨමාලා **9** ක් අදල වර්ෂය තුළදී පවත්වන ලදී. මෙම පාඨමාලාවලට මහජන පුස්තකාලයාධිපතීන් **357** ක් සහභාගි වූහ. පාඨමාලා **7** ක් අගනුවරදී ද අනෙක් පාඨමාලා **2** අනුරාධපුරය හා මඩකලපුවේදීත් පවත්වන ලදී.

**පුස්තකාල විද්‍යා ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ**

දිවයිනේ විවිධ ආයතනවල පුස්තකාල විද්‍යාව උගන්වන ගුරුවරුන්ට, ඉගැන්වීමේ නවතම විද්‍යාත්මක ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා **පස් දින සම්මන්ත්‍රණයක් අප්‍රේල් මාසයේදී පවත්වන ලදී.** මෙම සම්මන්ත්‍රණය **බ්‍රිතාන්‍ය කවුන්සිල් පුස්තකාල අධ්‍යාපන උපදේශිකා ඈන් අර්වින් මහත්මිය** විසින් මෙහෙයවන ලදී. පුස්තකාල විද්‍යා ගුරුවරුන් **30** ක් පමණ මෙයට සහභාගි වූහ.

**පුස්තකාල අධ්‍යාපන කටයුතු දියුණු කිරීම පිළිබඳ විශේෂඥ වාර්තාව**

දිවයිනේ පුස්තකාල අධ්‍යාපන කටයුතු විද්‍යානුකූලව සංවර්ධනය කරලීම සඳහා ඒ පිළිබඳ අධ්‍යයනයක් කරලීමට බ්‍රිතාන්‍ය කවුන්සලයේ ආධාර ඇතිව විදේශීය පුස්තකාල අධ්‍යාපන විශේෂඥවරියකගේ සේවය මණ්ඩලය මේ වසර තුලදී ලබා ගන්නා ලදී. මේ අනුව **ඈන්. අර්වින් මහත්මිය** ලංකාවේ පුස්තකාල අධ්‍යාපන කටයුතු පිළිබඳ මනා අධ්‍යයනයක් කොට අදල මූලික වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

**පුස්තකාල විද්‍යා ගුරුවරුන් පිළිබඳ තොරතුරු රැස් කිරීම**

දිවයිනේ විවිධ පුස්තකාල විද්‍යා ආයතනවල පුස්තකාල විද්‍යාව ඉගැන්වීමේ නිරත ගුරුවරුන් පිළිබඳ තොරතුරු 1983 වසරේදී මෙම අංශය මගින් රැස් කරන ලදී.

**පුස්තකාල විද්‍යා පාරිභාෂික ශබ්දමාලාව සකස් කිරීම**

මේ කාර්යයේදී පුස්තකාල සේවා මණ්ඩලය මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. එම සඳහා අවශ්‍ය අරමුදල සඳහා රු. 5000/– ක් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට සපයා දෙන ලද අතර අංශයේ මාණ්ඩලික නිලධාරිවරයා ශබ්දමාලා කමිටුවේ රැස්වීම්වලට සතිපතා සහභාගි වේ. පාරිභාෂික ශබ්දමාලාවේ ඒ අක්ෂරයේ සිට ජී අක්ෂරය දක්වා කොටස මෙම වසර තුලදී අවසන් වී ඇත. ඉදිරි මාස කිහිපය තුළ එය මුද්‍රණද්වාරයෙන් පිටවීමට නියමිතය.

**'පාසැල් පුස්තකාල සහ නව තොරතුරු මාධ්‍ය' ප්‍රකාශනය**

පාසැල් පුස්තකාල සඳහා සහ පාසැල් අධ්‍යාපන කටයුතු සඳහා '**නව තොරතුරු මාධ්‍ය**' උපයෝගි කර ගන්නා ආකාරය පිළිබඳව අංශය මගින් සකස් කරන ලද කුඩා ප්‍රකාශනයක මූලික වැඩ කටයුතු දැනට අවසාන කර මුද්‍රණය සඳහා භාරදී ඇත.

# THE AUTHOR, THE READER AND THE CONCEPT OF COPYRIGHT - II

**Ariyaratne Senadheera**

*Chief Librarian, University of Peradeniya*

**Infringement of Copyright**

Any person who wilfully infringes any of the rights protected by the Act shall be guilty of an offence and shall be liable on conviction to a fine not exceeding Rs. 20,000/- or to imprisonment for a term not exceeding 6 months or to both.

On subsequent conviction penalty can be doubled. As much as reprinting and selling copies of a copyright work without the consent of the author amounts to an infringement of copyright, one might little wonder that making two photocopies of an article by a reader using a copying machine kept in a library and passing one copy of it to a friend also amounts to an infringement of copyright. Such copying is considered an offence not because the reader has made two copies, but due to the fact that the second copy made for his private and personal use has been passed on to a second person.

Similarly a librarian bent on serving his readers, making a photo-copy of a book not available in his collections may be committing an offence under the Act if the book is available in print. His act of photocopying may be construed as conflicting with the normal exploitation of the work, i.e. sale of copies of that work in the book trade. His copying may result in the author's not being able to sell at least one copy of his work, thereby sustaining a financial loss.

**Regulation of Copyright Procedures**

For the convenient regulation of copyright procedures, the establishment of a copyright office is considered a pre-requisite. **However, our new Copyright Act does not provide for a Copyright Office although it has created a Registry of Patents and Trade Marks. In the absence of a Copyright Office in Sri Lanka, owners of copyrights have no facilities for registration of their works.** Although such registration is not an essential requirement for copyright protection, it facilitates easy regulation of the Act. **In Sri Lanka, the Printers and Publishers Ordinance has been in operation since 1885. One basic requirement of this ordinance is that printers submit five copies each of all their publications to the National Archives Department for registration. For all practical purposes such registration at the Archives Department has been reckoned as Copyright Registration, although in fact it is legally not so.** We have inherited this practice from Britain where printers are required to send copies of their publications to the British Museum. However, the British Museum receives these publications not under a Printers or Publishers Ordinance as in Sri Lanka, but under their copyright act of 1911. In USA printers are required to send their publications to the Copyright Office of the Library of Congress under their current copyright legislation.

**Copyright Notices**

Before I conclude, I wish to draw your attention to what are called 'Copyright Notices'. Often you may have seen them on the verse of title pages of books. They appear in a variety of forms such as 'Copyright', 'Copyright Reserved', or 'Copyright forbidden without consent of author'. There is absolutely no magic behind such notices. In our country whether or not such a notice appears in a book, authors' rights are protected from the time a literary work is produced irrespective of its publication.

However, in the field of international copyright here are two accepted forms of copyright notices.

Brussels revision of the Berne Convention provides for articles of current economic, political and religious topics to be reproduced in the Press without the permission of the authors unless reproduction is reserved. Perhaps you might have already noticed that this exception has been provided for in our new Copyright Act as well, as a limitation on the rights of the authors. In such instances, if the author was to indicate that his permission is necessary for reproducing such a work, the form of notice that should be displayed on the verse of the title page is '*Copyright Reserved*'. Absence of this notice means that the work can be reproduced without his permission.


International Copyright Convention has provided for another copyright notice of three elements :

(1) The symbol of letter C in a circe : ©.

(2) The year of the first publication of the work.

(Contd. on p. 14)

## STRUCTURE OF THE HELLIS NETWORK




( Fig: 1 )

This is done by exchange of resources or by developing common resources. By networking, the resources of all participating libraries become accesiible to all participating libraries. When acquiring library material by the nodal points duplication should be avoided in order to achieve effectiveness of resources with the help of rationalization schemes.

The following are some of the network operations adopted by HELLIS Sri Lanka Network.

* **Interlibrary Loans** : Loans of Books and periodicals. This will help the nodal points as well as the focal point to borrow books and periodical issues pertaining to health sciences, which are not available with them from other libraries.

* **Union Catalogue** ; The focal point has maintained a list of periodicals currently being subscribed by nodal points.

**Key to Abbreviations**

| | |
|---|---|
| **WHO/HQ** | - World Health Organization Headquarters |
| **AFOR** | - WHO Regional Office for Africa |
| **AMRO** | - WHO Regional Office for Americas |
| **EMRO** | - WHO Regional Office for Eastern Mediterranean |
| **EURO** | - WHO Regioual Office for Europe |
| **SEARO** | - WHO Regional Office for South-East Asia |
| **WHO** | - WHO Regional Office for Western Pacific |

* **Exchange** ; Exchange of publications, duplicate copies, past issues of periodicals and photocopies of articles.

* **Current Awareness** : Accession lists prepared by nodal points are being exchanged.

* **Directory of Health Sciences Libraries in Sri Lanka.**
This directory has been published by the Library and Documentation Service (LDS) of the NIHS. It serves as a prerequisite to mobilizing national resources in the field of health sciences. The editors intention is to make aware the people engaged in various disciplines appropriate to health sciences the existence of specialized collections housed in various libraries which are confined to restricted number of clientele.
In addition this directory serves the purpose of a resources base of various health sciences libraries. At the same time it would reveal shortcomings of the services they offer.

* **Health Sciences Library News Bulletin**
NIHS Library and Documentation Service has started bringing out from feb.1989, a bimonthly news bulletin and has so far published 08 issues. This news bulletin is intended to disseminate information pertaining to nodal points and other information useful to them.

***MEDLINE Search Service**
Medline (Medical Literature Analysis and Retrieval System (or Medlars on line) is a data base maintained by the National Library of Medicine Bethesda

(Contd. on p. 18)

# පුවත් ලුහුඬින්

## නව පුස්තකාලයක් ඉදිවෙයි

ගරු **අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදස මැතිතුමාගේ** යෝජනාවක් පරිදි කොළඹ 10, **සුචරිත ශාලාවට** අනුබද්ධව පුස්තකාලයක් ඉදිකිරීමේ **වැඩ කටයුතු** දැන් **ආරම්භ කර ඇත.** මෙම පුස්තකාලයේ ඉදිකිරීම් කටයුතු සඳහා තාක්ෂණික උපදෙස් **ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය** විසින් සපයන ලදී.

## පුස්තකාල සතිය සැමරීම

පුස්තකාල සතිය නිමිත්තෙන් **කඩුවෙල රොබට් ගුණවර්ධන** අනුස්මරණ පුස්තකාලයේ පුස්තකාලයාධිපතිනිය **කුසුමා ඇල්ලේපොල මිය** විසින් පොත් ප්‍රදර්ශන, දේශන හා වෙනත් ව්‍යාප්ත සේවාවන් රැසක් **නොවැම්බර් 26,27,28** යන දිනයන්හි සංවිධානය කරන ලදී. මේ සඳහා පළාත් පාලන සේවා කොමසාරිස් **පැරකුම් විජේසිංහ**, කොළඹ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ සභාපති **ඇල්මන් පීරිස්**, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති **එස්. අතුකෝරාල** යන මහත්වරු සහ සහකාර අධ්‍යක්ෂිකා **නාලිනී ද සිල්වා** මෙනෙවියද සහභාගී වූහ.

**ඉත්තෑපාන සංවර්ධන සභාවේ** පුස්තකාලයාධිපතිනිය **චන්ද්‍රා වික්‍රමරත්න මිය** විසින් **නොවැම්බර් 5** වෙනි දින එම පුස්තකාලය අළලා කථික තරඟ, චිත්‍ර, පෝස්ටර් තරඟ හා දේශන මාලා රැසක් ව්‍යාප්ත සේවා කටයුතු ලෙස සංවිධානය කරන ලදී. මෙදින ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් **රු. 500/-**ක් වටිනා පොත් කට්ටලයක් පරිත්‍යාග කරන ලදී.

## රද්දොළුගමට පුස්තකාලයක්

**රද්දොළුගම** ආදර්ශ නිවාස යෝජනා ක්‍රමයට අනුබද්ධව පිහිටුවන ලද මහජන පුස්තකාලය **ඔක්තෝබර් මස 16** වැනි ඉරිද කටාන රාජ්‍ය සභා නියෝජිත හා පේෂ කර්මාන්ත ඇමති **විජේපාල මැන්දිස්** මැතිතුමා විසින් විවෘත කරන ලදී. එදින ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

## ලංකාව පිළිබඳ දුලභ පොත් ඕස්ට්‍රේලියාවෙන් ලැබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා ලංකාව පිළිබඳව ලියැවී ඇති ඉතා දුර්ලභ ගණයේ අගනා පොත් කට්ටලයක් **ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලයෙන්** පරිත්‍යාග කරන ලදී. මෙම පොත් කට්ටලය ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය වෙනුවෙන් **ඇඩ්‍රියන් වැන් ඈෂ්** මහතා විසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති **ඇස්. අතුකෝරාල** මහතා වෙත **83.12.13** දින භාර දෙන ලදී.

## ජන සංස්කෘතික මධ්‍යස්ථානයක් ආරම්භවේ

දැනට අභාවයට යමින් පවතින ලංකාවේ ජාතික සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කිරීමේ අභිලාෂයෙන් **ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය** සහ **යුනෙස්කෝ ජාතික මණ්ඩලය** ජාතික පුස්තකාලයෙහි ආසියානු ජනසංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා යෝජනාකර ඇත. එම වැඩ පිළිවෙල අනුව **ජනකවි, ජනප්‍රවාද, ජනනැටුම්, ජාතික සිරිත්විරිත්** ආදි විවිධ දේ පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම සහ ඒවා සූචිගත කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය දැනට කටයුතු ආරම්භ කර ඇත.

## මණ්ඩලීය පත්වීම්:

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ **III ශ්‍රේණියේ පුස්තකාල සහකාර** තනතුරු සඳහා පහත නම් සඳහන් අය තේරීපත්ව ඇත.

| | |
|---|---|
| **කුසුමා ඒකනායක** මෙය. | **පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන අංශය** |
| **තමරා කුමාරි අබේගුණරත්න** මෙය. | -එම- |
| **සිරිමා ලීලානි කටුගම්පල** මෙය. | **ජන සංස්කෘතික මධ්‍යස්ථානය** |
| **ශාන්ත උපාලි අමරසිංහ** මයා. | **ප්‍රතිග්‍රහණ අංශය** |
| **ඩී. එස්. ලියනගේ** මෙය. | **පුස්තකාල අධ්‍යාපන අංශය** |
| **රේණුකා පණ්ඩිතරත්න වීරසේකර** මිය. | **සූචිකරණ අංශය** |

මණ්ඩලීය සේවයේ නියුක්තව සිටි පහත නම් සඳහන් අය **පුස්තකාල සේවක** තනතුරු සඳහා 81.11.15 දින සිට පත්වීම් ලබා ඇත.

| | |
|---|---|
| **පද්මා රත්නායක** මෙය. | **පුස්තකාල අධ්‍යාපන අංශය** |
| **පී. ජී. සිරිසේන** මයා. | -එම- |
| **රම්‍යා තෙන්නකෝන්** මෙය. | **පරිපාලන අංශය** |
| **චාන්දනී පතිරාජ** මෙය. | **ප්‍රතිග්‍රහණ අංශය** |
